# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| දිනය | : | 2017.05.16 |
| වේලාව | : | පෙ.ව. 8.30 |
| ස්ථානය | : | ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත. |

## සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :

| | | | |
|---|---|---|---|
| **1)** | එම්.ඒ.බී. දයා සෙනරත් මයා. | - | ප්‍රධාන ලේකම් (බ.ප) |
| **2)** | හේමන්ත සමරකෝන් මයා. | - | සභා ලේකම් (බ.ප) |
| **3)** | චන්ද්‍රානි සමරකෝන් මිය. | - | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප) |
| **4)** | එස්.ජී.විජයබන්ධු මයා. | - | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප) |
| **5)** | එම්.කේ.කේ.ආර්.අබේදීර මිය. | - | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය(බ.ප) |
| **6)** | ටී.වී.ඩී.ඩී.එස්.කරුණාරත්න මෙය. | - | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප) |
| **7)** | ඩබ්ලිව්.එම්.දයාවතී මිය. | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| **8)** | සිරිසෝම ලොකුවිතාන මයා. | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| **9)** | එන්. බන්දුල ප්‍රේමකුමාර මයා. | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| **10)** | ඩී.එම්.එන්.දිසානායක මිය. | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| **11)** | ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා. | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| **12)** | එස්.ඩී.ඒ.කීර්තිරත්න මිය. | - | ජ්‍යෙෂ්ඨ ස.ලේ. (ප.පා. අමාත්‍යාංශය-බ.ප) |
| **13)** | ඊ.ඒ.අනුෂා කුමාරි මිය. | - | සහකාර ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| **14)** | කේ.එන්.සූරියආරච්චි මිය. | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| **15)** | එස්.ඒ.එස්.දිස්මි ජයසූරිය | - | සහකාර ලේකම් (පාලන) කෘෂිකර්ම අමාත්‍යාංශය |

**ලේකම්වරුන් විසින් පහත කරුණු පිළිබඳ ව සාකච්ඡා කළ අතර, පහත දක්වා ඇති තීරණයන් ට එළඹෙන ලදි.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් සභා කාර්යාල එක ම භූමියක ස්ථාපිත කිරීම. | බත්තරමුල්ල නව පරිශ්‍රය වෙත බස්නාහිර පළාත් සභා කාර්යාල ගෙන යාමේ දී එම පරිශ්‍රයේ ස්ථානගත කරන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වාහන ගාල් කිරීමේ ගැටලුව ඇතුළු තවමත් නො විසඳුණු ගැටලු පිළිබඳ අවධානය යොමු කිරීම සහ ප්‍රධාන අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අවසන් තීරණයකට එළඹීම. | සභා ලේකම් සහ කමිටු සාමාජිකයින්.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු). |
| 02. | නිල නිවාස පිළිබඳ කාර්ය සාධන බලකාය සහ සංචාරක බංගලා ඉදි කිරීම | පළාත් සභා නිලධාරීන් සඳහා නිල නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට යෝජිත, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ඉඩමේ අක්කර 2කට අදාළ මිනින්දෝරු සැලැස්ම ඉදිරිපත් කිරීම.<br><br>උක්ත ඉඩමට අදාළ තක්සේරු වාර්තාව ලබාගැනීම.<br><br>මේ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් කඩිනමින් සකසා ඉදිරිපත් කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය ද සම්බන්ධ කර ගනිමින් රැස්වීමක් සංවිධානය කර වැඩ සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස දන්වන ලදි.<br>සංචාරක බංගලා ඉදිකිරීම සඳහා අනුරාධපුර. කතරගම, නුවරඑළිය යන ප්‍රදේශ වල ඉඩම් හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය.<br><br>ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු). |
| 03. | සංවර්ධන වැඩසටහන් සහ ප්‍රගති සමාලෝචනය. | එක් එක් අමාත්‍යාංශ මඟින් මෙම වසරේ ජනවාරි මුල් සතිය තුල දී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 79න් 49ක් සඳහා ප්‍රගතිය සමාලෝචනයට රැස්වීමක් කැඳවූ බව හා පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක වූ ඒවායේ ප්‍රගතියේ අඩුවක් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලදි.<br>අතිගරු ජනාධිපතිතුමාගේ සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සියල්ල නිරීක්ෂණය කර, එහි දී ගන්නා ලද ඡායාරූප සහ විස්තර ඇතුළත් ප්‍රගතිය කඩිනමින් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 04. | භාෂා ප්‍රතිපත්තිය, තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් නිල වෙබ් අඩවි යාවත්කාලීන කිරීම. | පළාත් සභාවේ සියලු ම අමාත්‍යාංශ / ආයතන වල වෙබ් අඩවි අවසාන වශයෙන් නිරීක්ෂණය කිරීම සඳහා ජුනි මස 17 වන සෙනසුරාදා දිනය යොදාගන්නා ලෙස ප්‍රධාන ලේකම් උපදෙස් ලබා දෙන ලදී.<br><br>ITRDI ආයතනය සමඟ සම්බන්ධ වී තම අමාත්‍යාංශ සහ ආයතන වල වෙබ් අඩවි ප්‍රතිසංස්කරණය කර ගැනීමට දින ලබා දුන් නමුත්, ඒ සඳහා ආයතන 7ක් සහභාගී වී නොමැති බැවින් නිදහසට කරුණු විමසා ලිපි ඉදිරිපත් කළ බවත්, ඒ සඳහා පිළිතුරු එවීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය |
| 05. | තොරතුරු තාක්ෂණය මඟින් සේවා වැඩි දියුණු කිරීම. | දැනට භාවිතා කරන පැරණි කාර්යාල ක්‍රම වෙනුවට නවීන තාක්ෂණය මුසු වූ ඩිජිටල් ක්‍රම අනුගමනය කිරීම සඳහා ක්‍රමවේද සැකසීම සඳහා ITRDI ආයතනය දැනුවත් කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලදී. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කමිටු සාමාජිකයන් |
| 06. | සංවර්ධන නිලධාරි අතිකාල දීමනා ලබා දීම. | කාර්යාලගත සේවාවල යෙදෙන, යතුරුපැදි ලබාගැනීම සඳහා නිර්දේශය ද නොලත් සංවර්ධන නිලධාරීන්ට 1/30 දීමනාව සහ අතිකාල ගෙවීම සඳහා නිර්දේශ කර අනුමැතිය සඳහා ආණ්ඩුකාරතුමා වෙත යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 07. | වෙනිවැල්කොල ව්‍යාපෘතියට අයත් අත් කඩදාසි යන්ත්‍ර කොලොන්නාව කසල අංගනයට බැහැර කිරීම. | ඒ අනුව ගිණුම් කාරක සභා උපදෙස් පරිදි නැවත මූලික විමර්ශනය පැවැත්වීමට නියෝග ලබා දී ඇත. මූලික විමර්ශනය පැවැත්වීම සඳහා නිලධාරියෙකු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරි සංචිතය මඟින් ලබාගැනීම සහ ඉදිරි කටයුතු සිදු කරන ලෙස ප්‍රධාන ලේකම් උපදෙස් ලබා දෙන ලදී.<br><br>එසේම මනා පුහුණුවක් ලබා දී පළාත් සභාව තුල විමර්ශන නිලධාරි සංචිතයක් සකස් කරන ලෙස ද වැඩිදුරටත් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 08. | ඔලියමුල්ල මහා විද්‍යාලයේ ඉදිකිරීම සම්බන්ධව. | ඔලියමුල්ල මහා විද්‍යාල භූමියේ පස පරීක්ෂා කිරීම සඳහා 2017.05.19 දින ඉංජිනේරුවන් ඇතුළු පිරිසක් යාමට නියමිත බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් ප්‍රධාන ලේකම් වෙත දන්වන ලදී.<br>එම පරීක්ෂණයෙන් අනතුරුව ඉදිකිරීම් කටයුතු සම්බන්ධව තීරණ ගැනීමට නියමිත ය. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 09. | ගරු ආණ්ඩුකාරතුමාගේ නිල නිවස ඉදිකිරීම. | ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය ප්‍රධාන ලේකම් වෙත යොමු කිරීමට සකස් කර ඇති වාර්තාව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ඉදිරිපත් කළ අතර, එය සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

| | | | |
|---|---|---|---|
| 10. | මෙත් සෙවන රජයේ නිවර්තන නිවාසය පිහිටි ඉඩම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට පැවරීම. | මෙත් සෙවන ආයතනය පිහිටි ඉඩම පැවරීමට නම්, එම ආයතනය සන්ෆ්ලවර් විලේජ් වෙත ගෙන යා යුතුය. මේ සඳහා කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම විධිමත්ව පවරා නොමැති අතර, ඉදිකිරීම් සඳහා නාගරික සංවර්ධන අධිකාරි අනුමැතිය ද ලැබී නොමැති බව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් ප්‍රකාශ කරන ලදි.<br><br>මේ වන විට මෙම කාර්යය සඳහා වෙන් කර ඇති කාල සීමාව අවසන් වී ඇති බව සාකච්ඡාවට බඳුන් විය. ඒ අනුව, කඩිනමින් කටයුතු කල යුතු බව දන්වන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය. |
| 11. | දරුවන් සුරකිමු ජාතික වැඩසටහන 2017-2019 | “දරුවන් සුරකිමු” 2017 – 2019 ජාතික සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා සෘජුව දායකත්වය සපයන, අමාත්‍යාංශ වලින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ගෙන්වා ගැනීමේ දී මෙම වැඩසටහන යටතේ සිදු කරන ක්‍රියාකාරකම් විශේෂ කොට දක්වා යොමුකිරීම හා ඊට අදාළ පළාත් සැලැස්මේ ඉදිරි කටයුතු සිදු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත උපදෙස් ලබා දෙන ලදි. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 12. | වකුගඩු රෝග නිවාරණ ජාතික සැලැස්ම සහ මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික සැලැස්ම. | “වකුගඩු රෝග නිවාරණ ජාතික සැලැස්ම 2016 – 2018” වැඩසටහනට සමගාමීව පළාත් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා සාකච්ඡාවක් 2017 ජුනි මස 13 වන දින පෙ.ව. 08.30 ට සංවිධානය කිරීම හා එම සාකච්ඡාව අවසානයේ මත්ද්‍රව්‍ය නිවාරණ පළාත් සැලැස්ම පිළිබඳව ද සාකච්ඡා කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

....................................

එම්.ඒ.බී. දයා සෙනරත්,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.